# තමිල් චෙල්වම් මල්ලී

උඹගේ සිනහව සුන්දරයි
කතාව ප්‍රිය මනාපයි
නායකත්වය සොඳුරුයි
ඒත් උඹ තෝරගත්
මාවත වැරදියි

උඹ උපන්නෙ පොඩි
පැල්පතක
සෙවිලි කළ තල් අතු
බිව්වෙ කිරි අම්මගෙන්
සුදු වුනත්
හදවතින් ගලා ආ
ලේ රතු
ස්කෝලෙ ගියේ
සැතපුම් ගනන් පයින්
පනිමින් කැලේ වතු
ඒත් නුඹ සටන් කළේ
ජාතියට පමණක්
වෙලා නතු

මාටින් ලූතර් ල
මහත්මා ගාන්ධි ල
තවමත් අපිත් එක්ක
හදවතේ කොනක
නොමැරී
ජීවත් වෙනව මල්ලී
මෙන්ඩලා මැරුනත්
එහෙම වෙයි
එතකොට උඹ කියයි
හිට්ලර්?
හදවත් තුළ
උන්ට තැනක් නැහැ
උන් ජීවත් වෙන්නෙ
පොත් ඇතුලෙ
විතරයි මල්ලි

චේ ලා ආයුධ අතට
ගත්තත් සටන් කළේ
පෑගෙන අපි වෙනුවෙන්
දිවි දුන්නෙ අපි වෙනුවෙන්
ඒ නිසා උන්
මැරෙන්නෑ මල්ලි

දුටු ගැමුණු ට එළාරව මරල
ගුණ ගායනා කරල
සොහොනක් හැදිය හැකිනම්
මං උඹ වෙනුවෙන්
මෙහෙම ලිව්වම මක් වෙනවද

උඹ වීරයෙක් දෙමළ ජාතියට
උඹ ද්‍රෝහියෙක් සිහල ජාතියට
ඒත් මේ දෙකම නිර්මානය
කළේ අපි ඒ කිව්වෙ
මිනිස්සු මල්ලි

හෙලුබැල්ලෙන් ඉපදිල
හෙලුබැල්ලෙන් වරිග හදල
උඩු බැල්ලෙන් පොළවට යන අපි
මේ වාතයට එකතු කළ
භයානකම දේ තමයි
වීරයා ද්‍රෝහියා

අහසට දෑත් පා ආමාශෙට
යමක් ඉල්ලන
පොළවට හිස තබා ඇස්
වසාගන්නට සෙවන ඉල්ලන
දෙවියන් යදින මිනිස්සු
වෙනුවෙන්
දෙවියෙක් වෙලා
මැරෙන අපි එකෙක්ගෙන්
කවුරු හරි නොඑන කන්
අපි දෙගොල්ලොම
මැරෙයි මල්ලි
එතකන් කට කහනවට
නිවන් සුව

ලක්ෂ්මන් කොඩිතුවක්කු